1988/4.

මගේ අංකය:- 5/4/36.
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
321, ගාලු පාර,
කොළඹ 03.
1988 . 11 . . 21 . . .

සියළුම දිසාපතිවරුන් වෙත,

1979 අංක. 43 දරණ ඉඩම් ප්‍රදාන
( විශේෂ විධිවිධාන ) පනත යටතේ බෙදා දී
<u>ඇති ඉඩම් උගසට තබා ණය මුදල් ලබා ගැනීම</u>

1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන ( විශේෂ විධිවිධාන ) පනත යටතේ බෙදා දී ඇති ඉඩම්, බැංකු වලට උගස් කොට ණය මුදල් ලබා ගැනීම සඳහා අනුමැතිය දීමේ බලය ඒ ඒ දිස්ත්‍රික්ක වල නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වරුන්ට මාගේ සමාංක හා 87.07.05 දරණ චක්‍රලේඛය මගින් දැනටමත් පවරා ඇත.

02. එම අනුමැතිය මත උගස් කරන ලද ඉඩම් සඳහා ණය ලබා දීමෙන් අනතුරුව එම ණය මුදල ආපසු නො ගෙවා පැහැර හරින අවස්ථා වලදී, බැංකු විසින් අනුගමනය කරන සාමාන්‍ය ක්‍රියා මාර්ගය අනුව එම ඉඩම් වෙන්දේසියේ විකුණා අදාළ මුදල් පියවා ගැනීමට අනුමැතිය දෙන ලෙස මූල්‍ය ආයතනයන් මා වෙතින් ඉල්ලුම් කර ඇත.

03. මේ සම්බන්ධයෙන් නීතිපති විමසූ විට 1979 අංක.43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 5(1)(අ) වගන්තිය යටතේ මා ගේ පූර්ව අනුමැතිය ඇතිව ඉඩම් උගසට තබා ණය මුදල් ලබා ගෙන ඇති අවස්ථාවක බැංකු අනුගමනය කරන ක්‍රියා මාර්ගය අනුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා නැවතත් මාගේ ලිඛිත අවසරය අවශ්‍ය නොවන බැව් ඔහුගේ මතය බැව් මා වෙත දන්වා ඇත.

04. ඉහත ඡේදයේ ප්‍රකාර ණය මුදල් පියවා ගැනීම සම්බන්ධයෙන් නැවත වරක් මාගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන අතර, අවස්ථාවෝචිත පරිදි අදාළ බැංකු වලට මේ අනුව කටයුතු කළ හැකි බව මෙයින් දන්වමි.

ඒ. ඒ. විජේතුංග
ඒ.ඒ.විජේතුංග.
ඉඩම් කොමසාරිස්.

පිටපත:- සභාපති, ලංකා බැංකුව.
මහජන බැංකුව.
රාජ්‍ය උගස් ආයෝජන බැංකුව.
} දැන ගැනීම සඳහා.

ප/18.
1 ඩ 91